*සැ. යු.*– 2007.06.29 වැනි දින පළකරන ලද 1,504 දරන *ගැසට් පත්‍රයේ* II කොටස පළ නොකරන ලදී.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,505 - 2007 ජූලි 06 වැනි සිකුරාදා - 2007.07.06**

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | 674 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... .. | 678 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | — | රට බිම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | 675 | වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් .. ... ... | 680 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | 394 | විවිධ දැන්වීම් ... ... ... | — |


*සැ. යු.*–(i) අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත 2007 මැයි මස 18 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) ශ්‍රී ලංකා මුස්ලිම් කවුන්සලය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2007 ජුනි මස 15 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(iii) සමන්තුරේ තබ්ලීකුල් ඉස්ලාම් අරාබි විද්‍යාලය (සංස්ථාපිත කිරීමේ) පනත් කෙටුම්පත 2007 ජුනි මස 08 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2007 ජූලි මස 13 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2007 ජුනි මස 29 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන**,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2007 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## සෞඛ්‍ය ආරක්ෂණ පෝෂණ සහ ඌව වෙල්ලස්ස සංවර්ධන අමාත්‍යාංශය

### කිළිටි රෙදි සේදීම - 2007/2008

*ටෙන්ඩරය සහ ටෙන්ඩර්කරුවන්ගේ සුදුසුකම්.-* 2007 ජූලි මස 15 වැනි දින සිට 2008 ජූලි මස 14 වැනිදායින් (දින දෙකම ඇතුළුව අවසාන වන වර්ෂය තුළ පවුල් සෞඛ්‍ය කාර්යාංශයේ කිළිටි රෙදි සේදීම සඳහා ශ්‍රී ලාංකිකයින්ගෙන් හා ශ්‍රී ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර පවුල් සෞඛ්‍ය කාර්යාංශයේ අධ්‍යක්ෂ (මාතෘ හා ළමා සෞඛ්‍ය) විසින් භාරගනු ලැබේ.

02. (i) *ටෙන්ඩර් තැන්පත් මුදල්.–* රුපියල් හත් දහසක (රු. 7,000)ක මුදලක් පවුල් සෞඛ්‍ය කාර්යාංශයේ අධ්‍යක්ෂ (මාතෘ හා ළමා සෞඛ්‍ය) නමට තැන්පත් කොට කුවිතාන්සියක් ලබා ගත යුතුය. අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති, ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුලත් සංගම් සහ විවිධ සේවා සංගම්වලට ද තැන්පත් නොතබා ටෙන්ඩර් පත් ඉල්ලිය හැක. කෙසේ හෝ වේවා එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි කළ අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

(ii) *ටෙන්ඩර් පත්‍ර.–* ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනට පෙර දිනයේ දහවල් 12.00 වන තුරු මෙම කාර්යාලයෙන් රුපියල් දෙසිය පණහක මුදලක් (රු. 250) ගෙවීමෙන් පසු ටෙන්ඩර් පෝර්ම ලබාගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දී මුදල් තැන්පත් කළ බවට ගන්නා ලද කුවිතාන්සිය ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුය.

(iii) ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝර්ම සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම්පත් වේලාසනින් එවිය යුතුය.

03. *වත්කම් විස්තර.–* සියලුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දී ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමට සැලකිය යුතු කාලයකට පළමු තම වත්කම් අධ්‍යක්ෂ (මාතෘ හා ළමා සෞඛ්‍ය) වෙත දැන්විය යුතුය. මේ සඳහා අවශ්‍ය ආකෘති පත්‍ර කාර්යාලයෙන් ලබාගත හැක. වත්කම් ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට අපොහොසත් වීම නිසා ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල් අහිමි වන්නට ඉඩ තිබේ.

04. *සෝදන කෑලි ප්‍රමාණය පිළිබඳ විස්තර.–* අයදුම්පත්‍රයේ සඳහන් කළ යුතුය.

05. *ටෙන්ඩර් එවිය යුතු අන්දම.–* සියලුම ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුතුව කවරයක බහා අධ්‍යක්ෂ (මාතෘ හා ළමා සෞඛ්‍ය) පවුල් සෞඛ්‍ය කාර්යාංශය, අංක 231, ද සේරම් පෙදෙස, කොළඹ 10 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කවරයේ වම් කෙළවරේ "කිළිටි රෙදි සේදීම සඳහා මිළ ගණන් " යනුවෙන් සඳහන් කළ යුතුය.

06. ටෙන්ඩර්පත් භාර ගන්නා අවසාන දිනය පුවත්පත් නිවේදනයේ සඳහන් කරනු ලැබේ.

07. *ටෙන්ඩර් පත් විවෘත කිරීම.–* ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවට එම ස්ථානයේ ටෙන්ඩර්කරුවන්ට සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කර ඇති මිළ ගණන් ටෙන්ඩර්කරුවන් ඉදිරියේ ප්‍රකාශ කරනු ලැබේ.

08. ටෙන්ඩර්කරුවන්ගේ සඳහන් මිළ ගණන් වලංගු කාල සීමාව ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡේදයේ සඳහන් කාලසීමාව ඉකුත් වන තුරු ගිවිසුම් පත්‍රයේ විශේෂ අවසරයක් නොවේ නම් එහි සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසා හෝ එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

09. *තැන්පත් මුදල්.–* තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු විසින් පළමු දින 10 ඇතුළත නියම කරනු ලබන ඇප මුදල් තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතු වේ.

10. *ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.–* ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි සෞඛ්‍ය 834 ඇපුල්ලුම් කොන්ත්‍රාත් පෝර්මයේ සඳහන් වේ.

සභාපති,
ප්‍රසම්පාදන කමිටුව.

පවුල් සෞඛ්‍ය කාර්යාංශය,
අංක 231, ද සේරම් පෙදෙස,
කොළඹ 10.

07-73

---

## ශ්‍රී ලංකා දුම්රිය සේවය

### ශ්‍රී ලංකා දුම්රිය සේවය මගින් ආනයනය කරනු ලබන භාණ්ඩ පරීක්ෂා කිරීම සඳහා පරීක්ෂකවරුන් පත් කිරීම

01. කොළඹ 10, ඕල්කොට් මාවතේ පිහිටි ශ්‍රී ලංකා දුම්රිය සේවයේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (සුළු) සභාපති විසින් ශ්‍රී ලංකා දුම්රිය සේවය සඳහා ආනයනය කරන භාණ්ඩ නැව්ගත කිරීමට පෙර පරීක්ෂා කිරීම පිණිස සුදුස්සෙකු පත්කර ගැනීම සඳහා පිළිගත් ආයතන මගින් ඉදිරිපත් කරන මුද්‍රා තබන ලද ටෙන්ඩර්පත් භාරගනු ලබයි.

02. ආපසු නොගෙවනු ලබන රු. 2,500ක මුදලක් හෝ පහසුවෙන් මාරුකළ හැකි ඒ හා සමාන විදේශ විනිමය ප්‍රමාණයක් ගෙවා කොළඹ 10, ඕල්කොට් මාවතේ, පිහිටි දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයෙන් හෝ විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලවලින් 2007.08.22 දින ප. ව. 3.00 (ශ්‍රී ලංකා වේලාවෙන්) දක්වා ලබාගත හැකි ටෙන්ඩර් ආකෘති පත්‍රවල පමණක් මිළ ගණන් ඉදිරිපත් කළ යුතුය.

03. 2007.08.24 දින ප. ව. 2.00 (ශ්‍රී ලංකා වේලාවෙන්) දක්වා ටෙන්ඩර්පත් භාරගනු ලැබේ.

04. ටෙන්ඩර්පත් භාරගැනීම අවසන් වූ වහාම කොළඹ 10, ඕල්කොට් මාවතේ, දුම්රිය මූලස්ථාන කාර්යාලයේදී ටෙන්ඩර්පත් විවෘත කරනු ලබන අතර, එම අවස්ථාවට ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ට සහභාගි විය හැකිය.

05. මුද්‍රා තබන ලද ටෙන්ඩර්පත් පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාරදිය හැක :-

සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (සුළු), ශ්‍රී ලංකා දුම්රිය සේවය, දුම්රිය මූලස්ථානය, ඕල්කොට් මාවත, කොළඹ 10.

06. කොළඹ 10, ඕල්කොට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේ දී ටෙන්ඩර් ආකෘති පත්‍ර නොමිලයේ පරීක්ෂා කර බැලිය හැක. වැඩි විස්තර සඳහා දුම්රිය ගබඩා අධිකාරී විමසන්න.

දුම්රිය ගබඩා අධිකාරී, ශ්‍රී ලංකා දුම්රිය සේවය, ඕල්කොට් මාවත, කොළඹ 10.

දුරකථ අංක : 94 (11) 2432044 හෝ 94 (11) 2436818
ෆැක්ස් අංකය : 94 (11) 2432044 ඊ මේල් : sis@sierra.lk
(යොමුව : එස්. ආර්. එස්/එෆ්.6580)

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව(සුළු),
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

07-113

---

## දිසා අධිකරණය – බලංගොඩ

බලංගොඩ දිසා අධිකරණයේ රාජසන්තක කරන ලද හා හිමිකම් නොපාන ලද පහත සඳහන් මෝටර් වාහන සඳහා 2007 අගෝස්තු මස 24 වැනි දින පෙ.ව. 10.00 දක්වා ටෙන්ඩර් භාර ගනු ලැබේ.

| අනු අංකය | විෂය | ටෙන්ඩර් ඇප තැන්පත් | |
|---|---|---|---|
| | | ආපසු නොගෙවන | ආපසු ගෙවන |
| 01 | 41 ශ්‍රී 3950 ලොරි රථය | රු.100 00 | රු.1,000 00 |
| 02 | 50 ශ්‍රී 5906 වෑන් රථය | රු. 100 00 | රු.1,000 00 |

එදිනම පෙ.ව. 10.15ට ටෙන්ඩර් පත් විවෘත කරනු ලබන අතර එම අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ට පෙනීසිටීමට අවසර දෙනු ලැබේ.

2007 ජූලි මස 01 වන දින සිට 2007 අගෝස්තු මස 23 වන දින දක්වා කාර්යාල වේලාවන් තුළදී ඉහත දක්වා ඇති පරිදි ආපසු ගෙවන හා නොගෙවන ටෙන්ඩර් ඇප තැන්පත් සඳහා බලංගොඩ දිසා අධිකරණය වෙත ගෙවූ ලදුපත් අධිකරණන රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කර ටෙන්ඩර් අයදුම්පත් ලබාගත හැකිය.

වාහන පරීක්ෂා කිරීම අධිකරණ රෙජිස්ට්‍රාර් වරයාගේ අවසරය මත කාර්යාල වේලාව තුළදී කළ හැකිය.

නිසි ලෙස සම්පූර්ණ කර සීල් තබන ලද ටෙන්ඩර්පත් රෙජිස්ට්‍රාර්වරයා, දිසා අධිකරණය, බලංගොඩ යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ ලොරි/වෑන් සඳහා ටෙන්ඩර් වශයෙන් සඳහන් කළ යුතුය. එක් අයදුම්පතක් ඉදිරිපත් කළ හැක්කේ එක් වාහනයක් සඳහා පමණි.

ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිගේ නියෝගය අවසන් නියෝගය වේ.

වයි. එච්. ජී. එස්. විජේවර්ධන,
රෙජිස්ට්‍රාර්,
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය,
බලන්ගොඩ.

2007 ජුනි මස 14 වැනි දින,
බලංගොඩ දී ය.

07-22

---

# බඩු බාහිරාදිය විකිණීම්

## අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ෂණ කොමිෂන් සභා කාර්යාලය

මෙම කොමිෂන් සභාවේ භාවිතයෙන් ඉවත් කරන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කටයුතු යොදා ඇත.

01. වෙන්දේසියේ විකුණනු ලබන භාණ්ඩ ලැයිස්තුවක් පහතින් දක්වා ඇත.

02. මෙම භාණ්ඩ 2007.07.26 වැනි දින පෙ. ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා කාලය තුළ කොමිෂන් සභා කාර්යාල පරිශ්‍රයේ දී පරීක්ෂාකර බැලිය හැකිය.

03. 2007.07.27 වැනි දින පෙ. ව. 10.00 ට භාණ්ඩ වෙන්දේසිය ආරම්භ වන අතර, ගැණුම්කරුවන් විසින් එදිනම මුදලින් වටිනාකම ගෙවා තමන් මිලදී ගත් ලොට් අංකයට අදාළ සියළුම භාණ්ඩ ප. ව. 6.00 ට පෙර මෙම කාර්යාල භූමියෙන් ඉවත් කරගත යුතුය.

පියසේන රණසිංහ,
අධ්‍යක්ෂ ජනරාල්.

207 ජුනි මස 19 වැනි දින,
අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා කාර්යාලය,
අංක 36, මලලසේකර මාවත,
කොළඹ 07.

### වෙන්දේසියේ විකුණනු ලබන භාණ්ඩ ලැයිස්තුව

| අයිතමය | සංඛ්‍යාව |
|---|---|
| 01. හෙවිඩියුටි කටු ඇමුණුම් යන්ත්‍ර | 01 |

| අයිතමය | සංඛ්‍යාව |
|---|---|
| 02. කටු ඇමුණුම් යන්ත්‍ර (සාමාන්‍ය) | 10 |
| 03. දුරකථන ලෙදර් ආවරණ | 01 |
| 04. ලෝහ ඉබ්බන් (3/4, 1 1/2, 2 1/4, 2 1/2) | 07 |
| 05. වාහන ඇදීමට ගන්නා කේබල් | 01 |
| 06. ගණක යන්ත්‍ර | 12 |
| 07. ඡායා පිටපත් යන්ත්‍ර (ෂාප්/ නෂුවාටෙක්) | 02 |
| 08. සිදුරු 2 සිදුකරණ (පංචර්) | 04 |
| 09. ජංගම දුරකථන (නොකියා/ඇල්කාටල්) | 07 |
| 10. පාපැදි (ලුමාලා) | 01 |
| 11. ලිපිගොනු බන්දේසි | 06 |
| 12. ටයර් .– 13, 15, 16 ප්‍රමාණය | 63 |
| 14 ප්‍රමාණය | 30 |
| 13. වාහන අමතර කොටස් | 200 (කි. ග්‍රෑම්) |
| 14. වායුසමීකරණ යන්ත්‍ර | 03 |
| 15. විදුලි පන්දම් | 02 |
| 16. විදුලි පංකා - බිත්ති | 01 |
| එම - සිවිලින් | 24 |
| එම - පාදස්තල | 06 |
| 17. විදුලි කේතල | 07 |
| 18. මාණ්ඩලික බෑග් | 10 |
| 19. කාන්තා බෑග් | 02 |
| 20. කාමර 3 බෑග් | 06 |
| 21. පරිගණක මුද්‍රණ යන්ත්‍ර (නෙක්) | 01 |
| 22. තිර රෙදි | 85 |
| 23. ලී කැබිනට් (වීදුරු මුහුණත) | 01 |
| 24. බිත්ති ඔරලෝසු | 01 |
| 25. කුඩ | 04 |
| 26. ජැකට් | 01 |
| 27. රෝනියෝ කඩදාසි පැකට් | 07 |
| 28. පැන්සල් (නිල්/රතු) | 305 |
| 29. ටෝනර් (ෂාප්/නෂුවාටෙක්) | 03 |
| 30. බ්ලැක් නයිලෝන් රිබන් (නෙක්) | 03 |
| 31. ජංගම දුරකථන බැටරි චාජර් | 04 |
| 32. පරිගණක මවුස් | 04 |
| 33. හිස් ආරක්ෂක ආවරණ (හෙල්මට්) | 05 |
| 34. අයි. බී. එම්. පරිගණක යතුරු පුවරු | 01 |
| 35. ඇමතුම් සීනු | 01 |
| 36. උද්‍යාන අලංකරණ ලාම්පු | 16 |
| 37. ලී පෙට්ටි | 02 |
| 38. ජනේලය (පියන් සහිත) | 01 |
| 39. දොර පියන් | 04 |
| 40. කොමඩ් (සිස්ටන් සමග) | 07 |
| සින්ක් (පිහල් මැටි) | 01 |
| 41. පරිගණක සී. පී. යූ | 01 |
| 42. යතුරු ලියන - විදුලි | 01 |
| එම - සිංහල | 03 |
| එම - ඉංග්‍රීසි | 04 |
| 43. විජ් බෝඩ් | 04 |
| 44. පරිගණක (උපාංග සහිත) | 01 |
| 45. හදිසි අවස්ථා (ඉමර්ජන්සි) ලාම්පු | 01 |
| 46. ශීතකරණ | 01 |
| 47. පුටු (වානේ/කුෂන්) | 01 |
| 48. වානේ සාමාන්‍ය පුටු | 05 |
| 49. ලී කුෂන් පුටු | 01 |
| 50. සාමාන්‍ය පුටු | 03 |
| 51. ඇඳි පුටු | 21 |
| 52. යතුරු ලියන පුටු | 04 |
| 53. ලිපිකරු මේස | 09 |
| 54. ලොකු මේස | 02 |
| 55. වානේ කබඩ් - ලාච්චු 4 | 02 |
| 56. වානේ කබඩ් - ලාච්චු 2 | 01 |
| 57. ඇලුමිනියම් කැබලි | 05 (කි. ග්‍රෑම්) |
| 58. ලී කැබලි | 50 (කි. ග්‍රෑම්) |
| 59. වෑන් රථ සීට් | 08 |
| 60. යතුරු පැදි - සුසුකි ජී. එස්. 125 (142 කාණ්ඩය) | 02 |

07-101

---

## මහාධිකරණය - හලාවත

### හලාවත මහාධිකරණය අලුත්වැඩියාවෙන් පසු ඉවත් කළ ලී උපකරණ හා අබලි ද්‍රව්‍ය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මෙහි පහත උපලේඛනයේ සඳහන් භාණ්ඩ 2007.07.26 වැනි බ්‍රහස්පතින්දා ප.ව. 2.00 ට හලාවත මහාධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබා වෙන්දේසිය පවත්වන දින ප.ව. 1.30 සිට 2.00 දක්වා අදාළ භාණ්ඩ පරීක්ෂා කළ හැකිය.

03. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව පිළිනොගන්නා අවස්ථාවලදී අධිකරණයේ අභිමතය පරිදි එම ද්‍රව්‍යයන් භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

04. වෙන්දේසියේදී මිලදී ගන්නා භාණ්ඩ එම අවස්ථාවේදී ම මුදලින් ගෙවීම් කළ යුතුය. මුදල් ඇණවුම්, චෙක්පත් භාර නොගන්නා අතර එදින පස්වරු 6.00ට ප්‍රථම සියළුම භාණ්ඩ අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතුවේ.

05. වෙන්දේසියේ දී භාණ්ඩ මිලදී ගන්නන් විසින් තමන්ගේ අනන්‍යතාවය ජාතික හැඳුනුම්පත හෝ ඒ සමාන ලියවිල්ලකින් තහවුරු කළ යුතුය.

එම්. සී. ජේ. මඩවල,
වයඹ පළාතේ මහාධිකරණ විනිසුරු,
මහාධිකරණය - හලාවත.

2007 ජූනි මස 12 වැනි දින,
හලාවත මහාධිකරණයේ දී ය.

### උපලේඛනය

| අනු අංකය | භාණ්ඩ පිළිබඳ විස්තරය |
|---|---|
| 01 | අඩි 6.2 x 1.7 දැල් සහිත දොර පියන් 2 යි |
| 02 | අඩි 3 x 2" . 3" දැල් කෑලි 22 යි. |

| අනු අංකය | භාණ්ඩ පිළිබඳ විස්තරය |
|---|---|
| 03 | දිග අඩි 10.6'' x 2.3'' දැල්කැලි 01 යි. |
| 04 | පොත් රාක්ක දිග අඩි 11.5 x 3.3 x 4.6 04 යි. |
| 05 | දිග අඩි 11 1.6 x 7 පොත් රාක්ක 1 යි (තරමක් දිරා ඇත) |
| 06 | දිග අඩි 16 1/2 මුල විශ්කම්භය අඩි 4 යි. අග විශ්කම්භය 2.6 ඉන්දියන් විලෝ ගස් කඳන් 01 යි. |
| 07 | උඩට වීදුරු ගැසූ අඩි 5.10'' x 5.6'' පාටිෂන් රාමු 01 යි. |
| 08 | උඩට වීදුරු ගැසූ අඩි 3.6'' x 5.10'' පාටිෂන් රාමු 01 යි. (දැව දිරා ඇත) |
| 09 | සිරමැදිරි (ප්‍රාථමික අධිකරණය - වෙන්නප්පුව) 01 යි. |
| 10 | සාක්ෂි කූඩු එම 01 යි. |
| 11 | විනිශ්චයාසනය එම 01 යි. |
| 12 | දිග අඩි 10' . 9'' පළල අඩි 2'6'' උස අඩි 5'4'' අබලන් රාක්ක 01 යි. |
| 13 | දිග අඩි 10 ' .9'' පළල අඩි 2'6'' උස අඩි 5'4'' අබලන් රාක්ක 01 යි. |
| 14 | දිග අඩි 10'.9 පළල අඩි 2'6'' උස අඩි 5'4'' අබලන් රාක්ක 01 යි. |
| 15 | දිග අඩි 10'.9'' පළල අඩි 2'6'' උස අඩි 5'4'' අබලන් රාක්ක 01 යි. |
| 16 | දිග අඩි 10'.9'' පළල අඩි 2'.6'' අබලන් රාක්ක 01 යි. |
| 17 | දිග අඩි 10''.9'' පළල අඩි 2'.6'' උඩ අඩි 5'.4'' අබලන් රාක්ක 01යි. |
| 18 | 8' x 3' දිරාගිය තහඩු 3 යි. |

07-02

---

## දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - තංගල්ල

තංගල්ල දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළ රාජසන්තක කරනු ලැබූ මෙතෙක් හිමිකම් නොකියන ලද විකුණා මුදල් රජයට බැර කිරීමට නියමිතව ඇති පහත සඳහන් ද්‍රව්‍ය 2007.08.11 වැනි දින පෙ. ව. 10.00 ට මෙම අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි පහත සඳහන් වන කිසියම් ද්‍රව්‍යයක් පිළිබඳ හිමිකම් දක්වන්නෙකු වේ නම් වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතුය.

03. රෙජිස්ට්‍රාර් වරයාගේ අවසරය ලබාගෙන වෙන්දේසිය ආරම්භ කිරීමට පැයකට ප්‍රථම වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ මහජනයාට පරීක්ෂා කර බැලිය හැකිය.

04. අධිකරණය විසින් නියම කරනු ලබන ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවලදී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් මිලදී ගනු ලබන භාණ්ඩ එවෙලේ ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතුය. සියලුම ගෙවීම් මුදලින් කළ යුතු අතර, චෙක්පත් ආදිය භාරගනු නොලැබේ.

06. භාණ්ඩ මිලදී ගන්නා පුද්ගලයන් තම ජාතික හැඳුනුම්පත් අනිවාර්යයෙන්ම රැගෙන පැමිණිය යුතුය.

තාමර තෙන්නකෝන්,
දිසා විනිසුරු සහ මහෙස්ත්‍රාත්,
තංගල්ල.

2007 ජුනි මස 13 වැනි දින,
තංගල්ල දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

B4–B 079519

### භාණ්ඩ පිළිබඳ විස්තරය

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 01. | ඒ. ආර්. 549/05 | අලු පැහැති "පීනි" වර්ගයේ ඉදිරිපස කූඩයක් සහිත තැලී ඇති පාපැදි | 01 |
| 02. | ඒ. ආර්. 293/06 | අංකය අපැහැදිලි කොළපාට ප්‍රේම් එක සහිත පාපැදි | 01 |
| 03. | ඒ. ආර්. 293/06 | අංක 158029 දරන පාපැදි | 01 |
| 04. | ඒ. ආර්. 293/06 | අංක ඊ. එන්. එෆ්. 15126 දරන පාපැදි | 01 |
| 05. | ඒ. ආර්. 293/06 | අංකය අපැහැදිලි රතුපාට ප්ලාස්ටික් මඩ්ගාඩ් එක සහිත නිල්පාට ප්‍රේම් එක සහිත පාපැදි | 01 |
| 06. | ඒ. ආර්. 334/06 | වර්ගය අපැහැදිලි, මල බැඳී ඇති ලගේජය සහිත පාපැදි | 01 |
| 07. | ඒ. ආර්. 368/06 | අංක 67319930 දරන ලුමාලා වර්ගයේ කලුපාට පාපැදි | 01 |
| 08. | ඒ. ආර්. 490/06 | නිල්පාට හා අලුපාට, අංක බී. සී. 08461468 දරන මවුන්ටන් වර්ගයේ මඩ්ගාඩ් රහිත පාපැදි | 01 |
| 09. | ඒ. ආර්. 626/06 | අංක 228050 දරන සිංගර් වර්ගයේ පාපැදි | 01 |
| 10. | ඒ. ආර්. 367/06 | අංකය හා වර්ණය අපැහැදිලි නිල්පාට පාපැදි | 01 |
| 11. | අංක රහිත | පිටුපස රෝදය ගැලවී ගැටගසා ඇති දිරාපත් පාපැදි | 01 |
| 12. | එම | පිටුපස රෝදය ගැලවී ඇති දිරාපත් පාපැදි | 01 |
| 13. | එම | ලොකු ලගේජය සහිත දිරාපත් පාපැදි | 01 |
| 14. | එම | අංක ආර්. 108333 දරන රැලේ වර්ගයට අයත් පැටල් කූරු දෙක පමණක් ඇති කලුපාට, දිරාපත් පා පැදි | 01 |
| 15. | එම | දිරාපත් පාපැදි | 01 |
| 16. | එම | මඩ්ගාඩ්, චේන්කේස් රහිත දිරාපත් පාපැදි | 01 |
| 17. | එම | "මොණරා" සඳහන් අංක රහිත දිරාපත් පාපැදි | 01 |
| 18. | එම | ලොකු ලගේජය, ලොක් එක සහිත දිරාපත් පාපැදි | 01 |
| 19. | එම | පැටල් කූරු දෙක පමණක් ඇති ලොකු ලගේජය සහිත ලොක් කරන ලද පාපැදි | 01 |
| 20. | එම | "රෂ් 99" සඳහන් දිරාපත් පාපැදි | 01 |
| 21. | එම | ලොකු ලගේජය සහිත "එවොන්" වර්ගයේ දිරාපත් පාපැදි | 01 |
| 22. | එම | රෝද දෙක තැලීගිය අබලන් පාපැදි | 01 |
| 23. | 88266 | ප්ලාස්ටික් ජලකරාම | 01 |
| 24. | 88268 | ප්ලාස්ටික් ජලකරාම | 01 |
| 25. | 89385 | ප්ලාස්ටික් ජලකරාම | 01 |
| 26. | 89381 | ප්ලාස්ටික් ජලකරාම | 01 |
| 27. | 89056 | (i) ලීටරය ප්‍රමාණයේ මිනුම්උපකරණ | 01 |
| | | (ii) රතුපාට ප්ලාස්ටික් පුනීල | 01 |
| 28. | 89265 | (i) ලීටරය ප්‍රමාණයේ මිනුම් උපකරණ | 01 |
| | | (ii) නිල්පාට ප්ලාස්ටික් පුනීල | 01 |
| 29. | 89114 | කම්බිඇණ ග්‍රෑම් | 200 |
| 30. | 89383 | අඟල් 2 ඇණ ග්‍රෑම් | 200 |
| 31. | 89375 | චීත්තරෙදි මීටර් | 01 |
| 32. | 89386 | (i) පොප්ලින් සුදු රෙදි මීටර් | 01 |
| | | (ii) පොප්ලින් සුදු රෙදි මීටර් | 1.79 |
| 33. | 89380 | සෙ. මී. 45 ක චීත්ත රෙදි කැබලි | 01 |
| 34. | 89377 | අත්ලේන්සු | 01 |

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 35. | 90962 | කැතිතල | 01 |
| 36. | 90291 | සවල් | 01 |
| 37. | 90364 | වයර් රෝල් | 01 |
| 38. | 90901 | වේවැල් කුඩ | 01 |
| 39. | 90902 | වේවැල් කුඩ | 01 |
| 40. | 90933 | කොස් දර ට්‍රේලර් 01 ක් පමණ | |
| 41. | අංක රහිත | හිස් ප්ලාස්ටික් කෑන් සහ බුලි තොගයක් | |
| 42. | එම | විවිධ ප්‍රමාණයේ සහ විවිධ වර්ගයේ හිස් බෝතල් තොගයක් | |
| 43. | එම | දිරාපත් වෙමින් පවතින යකඩ කැබලි තොගයක් | |
| 44. | එම | 1. ගොඩනැගිලි අලුත්වැඩියාවේ දී ඉවත් කරන ලද දිරාපත් සිවිලින් ෆෑන් | 01 |
| | | 2. සිවිලින් ෆෑන් පුලි | 04 |
| | | 3. පිහන් ගඩොල් සින්ක් | 01 |
| 45. | එම | අංක එස්. පී. එච්. වී. 2806 දරන යන්වාර් වර්ගයේ අත්ට්‍රැක්ටරය (ට්‍රේලරය සමග) | |
| 46. | 81851 | 1. සෝනි වර්ගයේ බෆල් | 01 |
| | | 2. රවුම් වේවැල් පුටු | 02 |
| | | 3. අහල් 32 ක් වූ එල්. ජී. වර්ගයේ ලාකොළ පාට ශීතකරණ | 01 |
| | | 4. වේවැලින් ගෙතූ සනීප පිටු (ලී වලින් සාදා ඇත) | 01 |
| | | 5. නිල් රෙද්දක් ගසා, ලී වල සුදුපාට තීන්ත ආලේප කල සනීප පුටු | 01 |
| | | 6. කකුල් කැඩී ගිය කුඩා ලී ඇඳන් | 01 |
| | | 7. කබඩ් දොරපලු | 01 |
| 47. | 81853 | 1. රවුම් කුඩා ස්ටූල් | 01 |
| | | 2. රෝද සහිත නිල්පාට ගමන් මලු | 01 |
| | | 3. කලුපාට ලෙදර් බෑග් | 01 |
| | | 4. රවුම් වේවැල් පුටු | 02 |
| | | 5. ලීටර් 2000 ධාරිතාව ඇති ඩයින වර්ගයේ කලුපාට වතුර ටැංකි | 01 |
| | | 6. උස අහල් 32 ක් වූ එල්. ජී. වර්ගයේ ලාකොළ පාට ශීතකරණ | 01 |
| | | 7. ජේ. වී. සී. වර්ගයේ බෆල් | 01 |
| | | 8. ලා කොළ පාට රෝස්ටර් | 01 |
| | | 9. සුදුපාට කුඩා රවුම් බුලි | 01 |
| | | 10. නිල්පාට ප්ලාස්ටික් පුටු | 02 |
| | | 11. කොළපාට වීදුරුබෝල | 01 |
| | | 12. කකුල් දෙකක් කැඩුනු මේස | 01 |
| | | 13. ප්ලයිවුඩ් වර්ගයේ දොර පලු | 02 |
| | | 14. සෝනි වර්ගයේ බෆල් | 01 |
| 48. | 81855 | කලුපාට කවරයක් සහිත අංක 3541336 දරන පෙන්ටෙක්ස් වර්ගයේ කැමරා | 01 |
| 49. | 81856 | 1. වේවැල් පුටු | 01 |
| | | 2. කකුල් තුනක ස්ටූල් එකක යට කොටස් | 01 |
| | | 3. රවුම් ස්ටූල් ලෑලි | 01 |
| | | 4. පියුස් බෝඩ් | 01 |
| | | 5. කොළ, කලුපාට කවරයක් සහිත මෙට්ට | 01 |
| 50. | 81857 | 1. ඇඳ ඉහ | 02 |
| | | 2. රවුම් මේස | 01 |
| 51. | 82688 | 1. නිල්පාට බ්‍රිෆ් කේස් | 01 |
| | | 2. පාට කරන ලද යක් මුණු | 08 |
| | | 3. පාට කරන ලද යක් ඇඳුම් | 11 |
| | | 4. හම් ගෙජ්ජි සළඹ | 04 |
| | | 5. ගෝනි ඇඳුම් | 02 |
| 52. | 82689 | උස අඩි 2 අහල් 7 1/2ක් ද, පළල අඩි 1 1/2ක් ද වූ සුදු පැහැති ශීතකරණ (නමක් නැති) | 01 |
| 53. | 82691 | 1. උස අඩි 4ක් වූ, ලා කොළපාට ඉදිරිදොර කැඩී ගිය ශීතකරණ | 01 |
| | | 2. සුදු පාට, අඩි 4ක් උස ශීතකරණ දොර | 01 |
| | | 3. කොකාකෝලා රතුපාට හිස් කේස් | 01 |
| | | 4. වේවැල් හාන්සි පුටු | 02 |
| 54. | 82692 | 1. කැඩී ගිය ලී ඇඳක හිස කොටස් | 01 |
| | | 2. කැඩී ගිය රවුම් ලී මේසයක කකුල් කොටස් | 01 |
| | | 3. රතුපාට, කොකාකෝලා හිස් කේස් | 01 |
| 55. | 82693 | 1. කැඩී ගිය අලුපාට බ්‍රිෆ් කේස් | 01 |
| | | 2. අලුපාට ජර්සි | 01 |
| | | 3. සුදු පාට ටී ෂර්ට් | 01 |
| | | 4. නිල්පාට ඩෙනිම් කලිසම් | 01 |

07-96

# ආණ්ඩුවේ නොවන දැන්වීම්

## බිස්නස්මේට් ප්‍රයිවට් ලිමිටඩ්

2007 අංක 07 දරන සමාගම් ආඥා පනතේ අංක 9 වැනි වගන්තිය ප්‍රකාර කරනු ලබන නිවේදනයයි

සමාගමේ නම - එක්ස්පෙරිමන්ට්ස් ප්‍රයිවට් ලිමිටඩ්
සමාගමේ අංකය - ජී. වී. 60096 දාතම 2007.05.29
සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය -අංක 45, බ්‍රේබෲක් වීදිය, කොළඹ 02.

ලේකම්වරු,

අංක 45, බ්‍රේබෲක් වීදිය,
කොළඹ 02.
2007 ජුනි මස 06 වැනි දින.

07-49/1

## බිස්නස්මේට් ප්‍රයිවට් ලිමිටඩ්

2007 අංක 07 දරන සමාගම් ආඥා පනතේ අංක 09 වගන්තිය ප්‍රකාර කරනු ලබන නිවේදනයයි

සමාගමේ නම - මන්දාකිණී ක්‍රියේෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය - ජී. වී. 60174 දාතම 2007.06.06
සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය -අංක 830, රොහිත මාවත, පැලවත්ත, බත්තරමුල්ල.

ලේකම්වරු,

අංක 45, බ්‍රේබෲක් වීදිය,
කොළඹ 02.
2007 ජුනි මස 07 වැනි දින.

07-49/3

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

No. 36, Swanage Waye Hayes Middlesex UB4 ONY United Kingdom යන ලිපිනයේ පදිංචිව සිට දැනට කුරුණෑගල නුවර පාරේ අංක 331/6 දරන නිවසේ පදිංචිව සිටිනා මොහොමඩ් කාසින් මොහොමඩ් නසීර් (පු. හැ. අ. 570413465 V) වන මා මාතලේ කුමාර වීදියේ අංක 39 දරන ලිපිනයේ පදිංචි මොහොමඩ් හාෂිම් මොහොමඩ් අබුබක්කර් (පු. හැ. අ. 551014410V) නමැති අයට No. 12, Old Square Lincoln's Inn LONDON WC 2A3TX යන ලිපිනයේ පදිංචි නීතිඥ එෆ්. එස්. සී. කෝදාගොඩ මහතා විසින් 2002.05.10 වැනි දින සහතික කර ඇටෝර්නි බලපත්‍ර පොතේ 237 වන කාණ්ඩයේ අංක 165 දරන පත් ඉරුවේ 4557 දරන දිනපොත් අංකය යටතේ ලියාපදිංචි කරමින් ලබාදී ඇති ඇටෝර්නි බලපත්‍රය අද දින සිට අවලංගු කර බල රහිත කර ඇති බව ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මින් දන්වා සිටිමි.

07-50

---

## බිස්නස්මේට් ප්‍රයිවට් ලිමිටඩ්

2007 අංක 07 දරන සමාගම් ආඥ පනතේ අංක 9 වගන්තිය ප්‍රකාර කරනු ලබන නිවේදනයයි

සමාගමේ නම - ජේ. ඩී. ඇසෝසියේට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය - ජී. වී. 60138 දාතම 2007.06.05
සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය-ගල්කඩේ හංදිය, අළුත්ගම, බණ්ඩාරගම.

ලේකම්වරු,

අංක 45, බ්‍රේබෲක් වීදිය,
කොළඹ 02.
2007 ජුනි මස 06 වැනි දින.

07-49/2

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරන දැන්වීම

2007 අංක 7 දරන සමාගම් පනත යටතේ පහත සඳහන් සමාගම 2007. 05.21 වැනි දින සංස්ථාපනය කරන ලද බව මහජනතාව වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම –සීමාසහිත රිලයන්ස් ඇසෝසියේට්ස්(ප්‍රයිවෙට්)
සමාගමේ අංකය - පී.වී. 60025

ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 09, අපොන්සු මාවත, ලක්ෂපතිය මොරටුව

ලේකම්,
සීමාසහිත රිලයන්ස් ඇසෝසියේට්ස් (ප්‍රයිවෙට්)
පී. වී. 60025.

07 – 85

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

සමාගමේ නම : ස්ජීඩ්මාක් ආරක්ෂක සේවා (පුද්) සමාගම
ලියාපදිංචි අංකය : පී.වී.– 60111
ලියාපදිංචි ලිපිනය : 180/C කළපළුවාව, රාජගිරිය
ලියාපදිංචි කල දිනය : 2007.05.30
අධ්‍යක්ෂ : ඒ. එස්. අමරසිංහ

07-128

---

## දැන්වීමයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් ආඥා පනතට අනුකූලව පහත සඳහන් සමාගම් සංස්ථාගත කර ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

| | *සමාගමේ නම* | *ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය* | *සංස්ථාගත අංකය* |
|---|---|---|---|
| 1. | ඔෂන් මර්කස්ටයිල් (ප්‍රයිවෙට්) ලිමිටඩ් | 08, ඒ, ඩීල් පෙදෙස, කොළඹ 03. | පී. වී. 60234 |
| 2. | වින්ඩ් මර්කන්ටයිල් (ප්‍රයිවෙට්) ලිමිටඩ් | 08, ඩීල් පෙදෙස, කොළඹ 03 | පී. වී. 60228 |
| 3. | හන්සි මර්කන්ටයිල් (ප්‍රයිවෙට්) ලිමිටඩ් | 188, පහළවෙල පාර, තලංගම දකුණ. | පී. වී. 60233 |

ක්‍රයිට්‍රරියා මැනේජ්මන්ට් (ප්‍රයිවෙට්) ලිමිටඩ්
සෙකට්‍රීස් (ලේකම්වරු)

2007 ක්වූ ජුනි මස 19 වන දීය.

07-92

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

සමාගම් ආඥාපනතේ (2007 අංක 07) සංස්ථාපිත කරනු ලැබූ නේවර් සොලූෂන් ප්‍රොවයිඩර්ස් (පුද්ගලික) සමාගම

සංස්ථාපිත කිරීම.- 2007 මැයි 28 වැනි සමාගම් ආඥා පනතේ (2007 අංක 07) අංක 9 (1) වගන්තිය යටතේ ප්‍රසිද්ධ දැන්වීම මත නම, සමාගමේ අංකය සහ ලියාපදිංචි සමාගම් කාර්යාලයේ ලිපිනය දක්වා තිබේ.

සමාගමේ නම.–නේවර් සොලූෂන් ප්‍රොවයිඩර්ස් (පුද්ගලික) සමාගම
සමාගම් අංකය.–පී වී 60075
සමාගම් ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය.–අංක 94, උඩුපිල, දෙල්ගොඩ.

නේවර් සොලූෂන් ප්‍රොවයිඩර්ස් (පුද්ගලික) සමාගම
අධ්‍යක්ෂක

ජුනි 2007
07-137

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## සීමාසහිත හැටන් නැෂනල් බැංකුව - හැටන් ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් එම්. එස්. පෙරේරා විසින් සහතික කරන ලද්දාවූද සී/සහිත හැටන් නැෂනල් බැංකුවේ නමට ලියන ලද්දා වූද 2005.12.06 වන දින සහ අංක 780 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම සිල්වෙස්ටර් ක්‍රිශාන් *හෙවත්* සිල්වෙස්ටර් සෙබස්තියන් ක්‍රිශාන් නඩරාජා නවරත්නම් සහ ඇන්ටන් රොනල්ඩ් සෙබස්තියන් ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින්,

සී/සහිත හැටන් නැෂනල් බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියළු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියළුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපල 2007 ජූලි මස 25 වන දින පෙ.ව. 11.00 ට ඇරඹෙන පරිදි දේපල පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ලේකම් කොට්ඨාශයේ, ඔය පළාත කෝරළේ, නුවරඑළිය නගර සභා සීමාව තුළ නේස්බයි වතුයායේ පිහිටි "නේස්බයි වත්ත" නමින් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මානක එච්. එම්. සමරනායක විසින් මැන සාදන ලද 2005.03.10 දිනැති අංක 4986 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 1 දරන නිරූපිත ඉඩම් කොටස (එම ඉඩම බලයලත් මානක පී. වික්‍රමසිංහ විසින් සාදන ලද 1996 ජනවාරි 19 දිනැති අංක 3198 දරන පිඹුරේ ලොට් 1 දරන කොටසකින් නැවත මැන සාදන ලද්දකි.) සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි හා සියළු දේත් සමග වේ.

විශාලත්වය: රූඩ් 1 යි පර්චස් 35 යි.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2007.05.18 දින දරන රජයේ *ගැසට් පත්‍රය* හා 2007.05.28 වන දින අයිලන්ඩ්. දිවයින සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය*:- වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එක (1%) ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%) ක් ද,
4. ලිපිකරු හා සෝෂක ගාස්තු රුපියල් පන්සියය (රු. 500) ක් ද,
5. සියළුම ප්‍රචාරක වියදම්,
6. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහ (රු. 2000) ක් ද වේ.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක්වූ මුදල විකිණීමේ දින සිට දින 30 ක් ඇතුලත සී/සහිත හැටන් නැෂනල් බැංකුව වෙත ගෙවිය යුතුය. දින 30 ක් ඇතුලත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට සහ දේපල නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා අදාළ ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ප්‍රධාන කළමනාකරු (ණය අයකිරීම්), සී/සහිත හැටන් නැෂනල් බැංකුව, අංක 479, ටී. බී. ජායා මාවත, කොළඹ 10.
දුරකථන අංක: 2661815, 2661816 ගෙන් ලබාගත හැක.

එන්. එච්. පී. එෆ්. ආරියරත්න,
උසාවි කොමසාරිස් හා බලයලත් වෙන්දේසිකරු,

අංක 34/31, සහ 32,
නීතිඥ කාර්යාල සංකීර්ණය,
කොළඹ 12.

07-135/1

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 0104401286.
ණයකරුගේ සම්පූර්ණ නම : කොන්තිගොඩ කංකානන්ගේ සජීව විරාජ් සහ ලලනි චම්පිකා ශ්‍රී ජලයත්.

(මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2005.05.06 වන දින අංක 1392 දරන ආණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2005.05.09 වන දින "ලක්බිම", "ද අයිලන්ඩ්", "තිනක්කුරල්" පුවත්පත්වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස (කෙසේ වුවද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකර ගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ, අංක 228/ඒ, වලව්වත්ත, කැස්බෑව ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු වන ඒ. එස්. ලියනගේ මයා විසින් 2007.07.26 වන දින පෙ. ව. 10.00 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් පන්ලක්ෂ දාහතර දහස් හැට පහයි ශත අසූ හයක් (රු. 5,14,065.86) මුදලක් වර්ෂ 2004.07.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත සංස්ථාවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් හාරලක්ෂ හැටඑක් දහස් එකසිය නවයයි ශත තිස් හතරක (රු. 4,61,109.34) මුදල ද, 2004.07.31 වන දින දක්වා පොලිය වශයෙන් රුපියල් පනස් දෙදහස් නවසිය පනස්හයයි ශත පනස් දෙකක් (රු. 52,956.52) වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් පන්ලක්ෂ දාහතර දහස් හැට පහයි ශත අසූ හයක් (රු. 5,14,065.86) ද,

(2) එකී රුපියල් හාරලක්ෂ හැටඑක් දහස් එකසිය නවයයි ශත තිස් හතරක (රු. 4,61,109.34) මුදල මත අයවිය යුතු වර්ෂයකට 14.5%

බැගින් වන පොළියක් 2004.08.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීමට.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේපත්තුවේ, සල්පිටි කෝරළේ, මොරටුව නගර සහා සීමාවේ විල්ලෝරාවත්ත ග්‍රාමයේ ශාන්ත වාල්ස් පාරේ, වරිපනම් අංක 34හි පිහිටි ගල්වැටියාවත්ත සහ මිල්ලගහවත්ත නැමැති ඉඩමට 2000.11.29 දින එම්. එම්. කුරේ මානක තැන විසින් මැන සම්පාදිත අංක 2490 පිඹුර ප්‍රකාර ලොට් 1ට මායිම්, උතුරට: ශාන්ත වාල්ස් පටුමහ ද ; නැගෙනහිරට : පිඹුරු අංක 3614හි කැබලි අංක ඒ සහ ඇනී එනල්තිනා ප්‍රනාන්දුගේ ඉඩම ද ; දකුණට : කැබලි අංක 3 සහ 2 ද ; බටහිරට: කැබලි අංක එෆ් (අඩි 10 පළල මාර්ග රක්ෂිතය) ද යන මායිම් තුළ පිහිටි පර්චස් දහයයි දශම අටයි බිංදුවක (අ. 0, රූ. 0, පර්. 10.80) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළු දේද මාර්ග පරවශතාවය ද සමඟ ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 2555/22හි ලියාපදිංචි කර ඇත.

වර්ෂ 2007 ක් වූ ජූනි මස 22 වැනි දින කොළඹ දී ය.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

07-116

---

### මහජන බැංකුව - සුදුවැල්ල ශාඛාව

1986 අංක 32 දරන පනත විසින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී කොටස යටතේ වෙන්දේසි කිරීම

#### වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාව තුළ, මරදානෙහි පිහිටි, බලයලත් මිනින්දෝරු සිරි ඩී. ලියනසූරිය මහතා විසින් 1982.08.03 දාතමින් යුතු අංක 2563 පිඹුරු පතෙහි දක්වන ලද ලොට් අංක 1 ලෙස සලකුණු කරන ලද බිම් කොටසේ වෙන් කර සහතික කරන ලද සියල්ල මරදාන, අංක 26 නගර සහා බල ප්‍රදේශය, දේවානම්පියතිස්ස මාවත, අංක 153 දරන තක්සේරුව පවත්නා ප්‍රමාණය ලොට් අංක 1- අක්. 0 රූඩ් 0 පර්. 6.95 එහි පවත්නා සියල්ල සහිතව මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ 2007 ජූලි මස 26 වැනි දින (බ්‍රහස්පතින්දා) පෙරවරු 11.00 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

තීරණය පිළිබඳ දැන්වීම සඳහා 1998.06.05 *රජයේ ගැසට් පත්‍රයද*, 1998.05.21 පුවත් පත් (දිනමිණ, ඩේලිනිව්ස් සහ තිනකරන්) ද බලන්න.

*ගෙවීමේ ක්‍රමය.*– මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතුය.

1. ගැණුම් මිළෙන් 10%ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1%ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාර),
4. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
5. වෙන්දේසි පිරිවැය සහ වෙනත් අය කිරීම් වෙතොත්,
6. වෙන්දේසි සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිළෙන් 90% ක් වූ ඉතිරිය වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත සහකාර සාමාන්‍යාධිකාරී, මහජන බැංකුව, කලාප මූලස්ථානය, (බටහිර 1), අංක 11, ඩියුක් වීදිය, කොළඹ 1 වෙත ගෙවිය යුතු වේ.

දුරකථන අංක : 2387068, 2344983.

යථෝක්ත ලිපිනයෙන් අදාළ ඔප්පු සහ අනෙකුත් විස්තර ලබා ගත හැකිය. ඉහත සඳහන් කළ පරිදි දින 30ක් ඇතුළත ඉහත සඳහන් කරන ලද මුළු මුදල ගෙවනු නොලැබුවහොත් දැනට ම ගෙවනු ලැබ ඇති විකුණුම් මිළෙන් 10% බැංකුව සන්තක කිරීමේ සහ දේපළ නැවත වෙන්දේසි කිරීමේ බලය බැංකුව සතු වේ.

ෂොක්මන් සහ සමරවික්‍රම,
**ISO** 9001 : 2000 සහතිකය ලත්, ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ,
පුරෝගාමී වරලත් වෙන්දේසිකරුවෝ, උපදේශක
තක්සේරුකරුවෝ සහ ඉඩම් අලෙවි නියෝජිතයෝ.

*ප්‍රධාන කාර්යාලය* :
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංක : 081-2227593,
දුරකථන/ෆැක්ස් : 081-2224371,
ඊමේල් : schokmankandy@sltnet.lk.

*නගර කාර්යාලය:*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 5
දුරකථන අංක : 011-2502680, 2585408,
දුරකථන/ෆැක්ස් : 011- 2588176,
ඊමේල් : schokman@sameral 1982com.

07- 99

---

### ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 2500001443.

ණයකරුගේ සම්පූර්ණ නම : කුඩා දුරයලාගේ ප්‍රයන්ත කුමාර සහ කුඩා දුරයලාගේ රංජිත්

(මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2006.08.04 වන දින අංක 1454 දරන ආණ්ඩුවේ *ගැසට්*

*පත්‍රයේ* සහ වර්ෂ 2006.08.08 වන දින "ද අයිලන්ඩ්",සහ "තිනක්කුරල්" පුවත්පත්වල ද වර්ෂ 2006.08.09 දින "ලක්බිම", පුවත්පතේ ද පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස (කෙසේ වුවද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකර ගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ, අංක 28, නව කාර්යාල සංකීර්ණය, කුමාරතුංග මාවත, කුරුණෑගල ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු වන ඩබ්ලිව්. එම්. අයි. ගල්ලැල්ල මයා විසින් 2007.07.24 වන දින පෙ. ව. 11.30 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් දෙලක්ෂ විසි අට දහස් හත්සිය හතලිස් නවයයි ශත දහඅටක් (රු. 2,28,749.18) මුදලක් වර්ෂ 2005.08.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත සංස්ථාවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් එක්ලක්ෂ අසූහත් දහස් හාරසිය එකොලහයි ශත හැත්තෑ හයක (රු. 1,87,411.76) මුදල ද, 2005.08.31 වන දින දක්වා පොලිය වශයෙන් රුපියල් හතලිස් එක් දහස් තුන්සිය තිස් හතයි ශත හතලිස් දෙකක් (රු. 41,337.42) වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් දෙලක්ෂ විසි අට දහස් හත්සිය හතලිස් නවයයි ශත දහඅටක් (රු. 2,28,749.18) ද,

(2) එකී රුපියල් එක්ලක්ෂ අසූහත් දහස් හාරසිය එකොලහයි ශත හැත්තෑ හයක (රු. 1,87,411.76) මුදල මත අයවිය යුතු වර්ෂයකට 15.90% බැගින් වන පොලියක් 2005.09.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීමට.

### උපලේඛනය

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, පරණකුරු කෝරළේ, මාවත පත්තුවේ, කෑගල්ල නගර සභා සීමාවේ, පිටිහුම ග්‍රාමයෙහි බෙලිගස් පාරේ , වරිපනම් අංක 96/03 හි පිහිටි පිටිගෙතැන්නවත්ත නැමැති ඉඩමට 2002.01.24, 2002.03.06 දින ටී. එන්. කාදර් මානක තැන විසින් මැන සම්පාදිත අංක 4230 ඒ පිඹුර ප්‍රකාර ලොට් 01ට මායිම් උතුරට: නිවෙස්වල සිට බෙලිගස් පාර දක්වා දිවෙන නගර සභා පාර (අංක පී. පී. කෑ. 1809 පිඹුරෙහි ලොට් 12) ද ; නැගෙනහිරට : අංක පී. පී. කෑ. 1809 පිඹුරෙහි කැබලි අංක 13 ද, ; දකුණට : නිවෙස්වල සිට බෙලිගස් පාර දක්වා දිවෙන පාරක් ද ; බටහිරට: අංක පී. පී. කෑ. 1809 පිඹුරෙහි කැබලි අංක 15 ද, යන මායිම් තුළ පිහිටි පර්චස් විසිඑකයි දශම පහක (අක්. 0 රූඩ් 0 පර්. 21.5) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියලු දේ ද මාර්ග පරවශතාවය ද සමග කෑගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කෑ. 13/36 හි ලියාපදිංචි කර ඇත.

වර්ෂ 2007ක් වූ ජූනි මස 22 වැනි දින කොළඹ දී ය.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

07-114

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 1800001025.

ණයකරුගේ සම්පූර්ණ නම : අතුකෝරලලාගේ චන්ද්‍රරත්න.

(මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2003.11.14 වන දින අංක 1315 දරන ආණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2003.11.18 වන දින "දිනමිණ", "ද අයිලන්ඩ්", "තිනක්කුරල්" පුවත්පත්වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස (කෙසේ වුවද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකර ගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ, අංක 28, නව කාර්යාල සංකීර්ණය, කුමාරතුංග මාවත, කුරුණෑගල ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු වන ඩබ්ලිව්. එම්. අයි. ගල්ලැල්ල මයා විසින් 2007.07.25 වන දින පෙ. ව. 11.30 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් දෙලක්ෂ හතලිස් එක් දහස් හතලිස් හතරයි ශත හතලිස් එකක් (රු. 2,41,044.41) මුදලක් වර්ෂ 2003.02.28 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත සංස්ථාවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් එක්ලක්ෂ අනූහත් දහස් පන්සිය හැට නමයයි ශත හැත්තෑ දෙකක (රු. 1,97,569.72) මුදල ද, 2003.02.28 වන දින දක්වා පොලිය වශයෙන් රුපියල් හතලිස් තුන් දහස් හාරසිය හැත්තෑ හතරයි ශත හැට නවයක් (රු. 43,474.69) වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් දෙලක්ෂ හතලිස් එක් දහස් හතලිස් හතරයි ශත හතලිස් එකක් (රු. 2,41,044.41)ද,

(2) එකී රුපියල් එක්ලක්ෂ අනූහත් දහස් පන්සිය හැට නවයයි ශත හැත්තෑ දෙකක (රු. 1,97,569.72) මුදල මත අයවිය යුතු වර්ෂයකට 13.90% බැගින් වන පොලියක් 2003.03.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීමට.

### උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, උතුරු යටිකහ කෝරලේ කටුගම්පොල හත්පත්තුවේ පඩුවස්නුවර ප්‍රාදේශිය සභා සීමාවේ බෝධිමුල්ල ග්‍රාමයේ හි පිහිටි ගල්ගොඩයායේහේන නැමැති ඉඩමට 1998.06.02 දින ආර්. බී. නවරත්න මානක තැන විසින් මැන සම්පාදිත අංක 3747 පිඹුර ප්‍රකාර ලොට් 02 ට මායිම්, උතුරට: එච්. ඒ. කමලා හපුආරච්චිගේ ඉඩමේ ඉම හා ප්‍රාදේශීය සභා පාර ද ; නැගෙනහිරට : එන්. එම්. නිමල් ආනන්දගේ ඉඩම වෙන් වන ඉඩම ද ; දකුණට : එම්. එම්. විමලාවතීගේ ඉඩම ද, එන්. එම්. නිමල් ආනන්දගේ ඉඩම ද ; බටහිරට:ලොට් 1 වෙන් වන ඉඩම ද, යන මායිම් තුළ පිහිටි රූඩ් දෙකයි පර්චස් විසිහයක් (අක්. 0 රූ. 2, පර්. 26) වපසරියකින්

යුතු මෙම ඉඩම හා ඊට අයත් සියලු දේ ද සමග කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජේ 110/253 හි ලියාපදිංචි කර ඇත.

වර්ෂ 2007ක් වූ ජුනි මස 22 වැනි දින කොළඹ දී ය.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

07-117

---

## මහජන බැංකුව - ආනමඩුව ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

ආඩිගම, පහල කඩයන්දඑව ග්‍රාමයේ පිහිටි පදිංචියට සුදුසු වටිනා දේපළ, විශාලත්වය පර්චස් 35.62.

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2007.07.30 වැනි දින පෙ. ව. 11.30 ට දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ මවිසින් විකුණනු ලැබේ.

*රජයේ ගැසට් පත්‍රයේ* 2004.12.03 දින ද, දිනමිණ, ඩේලිනිව්ස්, තිනකරන් පුවත්පත් වල 2004.11.23 දින පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.–* හලාවත, ආණමඩුව මාර්ගයේ ආඩිගම සිට තිකවැරටිය පාරේ යන විට හමුවන ෆවුසි මාවතේ තවත් සැතපුම් 02ක් ගිය තැන හමුවන මදවක්කුලම, මුස්ලිම් පල්ලිය පසු කරන විට හමුවන වංගුවේ අදාල දේපල පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.–* වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැණුම් මිළෙන් 10%ක්,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිළෙන් 2 1/2%ක්,
4. ලිපිකරු සහ නිවේදකයේ ගාස්තු වශයෙන් රු. 500ක්,
5. විකුණුම් වියදම් සහ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිළෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත නාත්තන්ඩියේ පිහිටි, මහජන බැංකුව, හලාවත ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ ප්‍රාදේශීය කළමණාකරු වෙත ගෙවිය යුතුය.

දුරකථන අංක : 032-2253301, 032-2253300
ෆැක්ස් අංකය : 032-2255247

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාල විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබා ගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30ක් ඇතුලත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10%ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ඩබ්. පී. සී. පෙරේරා,
බලයලත් වෙන්දේසිකරු තක්සේරුකරු
සහ උසාවි කොමසාරිස්.

අංක 22, ප්‍රනාන්දු මාවත,
මීගමුව.
දුරකථන අංකය : 031-2223219.

07-72

---

## මහජන බැංකුව - බොරුල්ල ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ මා වෙත පවරන ලද බලය පරිදි වෙන්දේසියේ විකිණීම

### ශ්‍රී ලංකා රබර් ප්‍රොඩක්ට්ස් එක්ස්පෝට් කෝපරේෂන් මාවනැල්ල (ප්‍රයිවෙට්) ලිමිටඩ් ඇවැන්ත වෙන්දේසිය

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, ගලබොඩ කෝරලේ, ගලබොඩ පත්තු ඩී. ආර්. ඕ. කොට්ඨාසයේ රන්කොත්දිවෙල කොට්ඨාශය අංක 03, මාවනැල්ල සුළු නගර සභා සීමාව තුළ නුන්ගොමුව ග්‍රාමයේ පිහිටි නුන්ගොමුව පාරේ වරිපනම් අංක 15/16 සහ 15/17 දරන "යග්ගලේවත්ත" නමැති ඉඩමෙන් මිනුම්පති වෙනුවෙන් සබරගමුව කොට්ඨාශයේ මිනුම් කොමසාරිස් විසින් සාදන ලද 1972 මාර්තු 6 දාතම හා අංක 578 දරන පිඹුරේ ලොට් 1 වශයෙන් ලකුණු කොට දක්වා ඇති අගනා සම්පූර්ණ බිම් කොටස එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වගාවන් පස සහ සෑම සියලු දේ සමඟ (ප්‍රමාණයෙන් අක්. 12 රූඩ් 00, පර්. 29 ක ඉඩම) මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය පරිදි මා විසින් 2007 ජූලි මස 24 වැනි අඟහරුවාදා පෙ. ව. 11.30ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*රජයේ ගැසට් පත්‍රයේ* 2004.09.24 වන දින හා ඩේලිනිව්ස්, දිනමිණ පුවත්පත් වල 2004.09.08 දින ද පළ කරන ලද යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනයට සහ *රජයේ ගැසට් පත්‍රයේ* 2007.07.06 දින පළ කරන ලද විකුණුම් නිවේදනයට ද අවධානය යොමු කරන්න.

සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් මුදලින් ගෙවිය යුතුය.

*ගෙවීමේ ක්‍රමය–*

1. මිල තීන්දු වූ වහාම ගැනුම් මිලෙන් 10% ක් (සියයට දහයක්)
2. පළාත් අධිකාරියේ අළෙවි බදු වශයෙන් 1% ක් (සියයට එකක්)
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක් (සියයට දෙකහමාර)
4. ලිපිකරු හා ඝෝෂකගේ ගාස්තුව රු. 500 ක්
5. විකුණුමේ පිරිවැය හා අයකිරීම් වෙතොත් ඒවා
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තුව

ගැණුම් මිලෙන් ඉතිරි 90% (සියයට අනූව ) ක් වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත, කොළඹ 01, ආදිපාද වීදියේ අංක 11 හි මහජන බැංකු කලාපීය කාර්යාලයේ (බස්නාහිර පළාත 01) සහකාර සාමාන්‍යාධිකාරී වෙත ගෙවිය යුතුය. දුරකථන 2387068/2393678 හා 2344985 ඉහත සඳහන් කළ පරිදි එකී මුදල් දින 30ක් ඇතුළත ගෙවනු නොලැබුවහොත් දැනටමත් ගෙවා ඇති 10% මුදල් අහිමි කොට දේපළ නැවත විකිණීමේ අයිතිය බැංකුව සතුය.

ඩන්ස්ටන් කෙලාට්,
උසාවි කොමසාරිස් සහ බ්‍රෝකර්, රජයේ
සහතික ලත් විශේෂඥ වෙන්දේසිකරු,
තක්සේරුකරු සහ දේපල නියෝජිත.

42, දුටුගැමුණු වීදිය,
පාමංකඩ, දෙහිවල.
දුරකතනය : 2814743
ෆැක්ස් : 2814742 – 2814744.
ක්ෂණික ඇමතුම්: 07722-50422

07 –133

---

## සීමාසහිත සෙලාන් බැංකුව – පරණ යොන් වීදිය ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විකිණීමයි

මීරාණියා වීදිය – කොළඹ 12, අගනා වාණිජමය දේපළ

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාව තුළ, නාගරික කොට්ඨාශ අංක 16, අළුත්කඩේ නැගෙනහිර කොට්ඨාශයේ, අළුත්කඩේ, මීරාණියා වීදියේ පිහිටි බලයලත් මිනින්දෝරු එම්. වී. සමීර් විසින් සාදන ලද 1964.02.07 දාතම හා අංක 810 දරන පිඹුරේ ලොට් **J** හි කොටසක් වන, බලයලත් මිනින්දෝරු ජේ.පී. අයි.අබේකෝන් විසින් සාදන ලද 1996 නොවැම්බර් 14 දාතම හා අංක 5511 දරන පිඹුරේ ලොට් 1 වශයෙන් ලකුණු කොට නිරූපිත මීරාණියා වීදියේ (කලින් තොටුපොළ වීදිය) වරිපනම් අංක 209 දරන බෙදා වෙන් කොට සීමා නිර්නය කළ සම්පූර්ණ බිම් කොටස (ප්‍රමාණයෙන් පර්චස් .75 ක ඉඩම) සීමාසහිත සෙලාන් බැංකුව විසින් මා වෙත පවරන ලද බලය පරිදි ඉහත කී දේපල ම විසින් පිහිටි ස්ථානයේ දී 2007 ජූලි මස 23 වැනි දා (සඳුදා) පෙ.ව. 10.30 ට ආරම්භ කොට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. ( ප්‍රසිද්ධ නොතාරිස් එම්. ඊ. එස්.පීරිස් විසින් ලියා සහතික කළ 1998.10.15 දාතම හා අංක 1225 දරන බැඳුම්කරය මත ගෙවිය යුතු මුදල් ගෙවීම බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති කොළඹ මොහමඩ් ඉස්මයිල් මොහමඩ් සාරුක්ට අයත් දේපළ)

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 1999.12.03 වන දින *රජයේ ගැසට් පත්‍රය හා* 1999.11.12 වන දින ඩේලිනිවුස්, දිනමිණ, හා තිනකරන් යන පුවත්පත් ද විකුණුම් නිවේදනය සඳහා 2007.07.06 වන දින රජයේ *ගැසට් පත්‍රය* ද බලන්න.

*ගෙවීමේ ක්‍රමය* - විකිණීම ස්ථිර කළ වහාම ගැනුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුවේ :

(1) ගැනුම් මිලෙන් 10% මිල තීන්දු වූ වහාම ගෙවිය යුතුය,
(2) ගැණුම් මිලෙන් ඉතිරි 90% වෙන්දේසි දින සිට වැඩ කරන දින 30ක් ඇතුළත ගෙවිය යුතුය,
(3) පළාත් අධිකාරියට ගෙවිය යුතු දේශීය විකුණුම බද්ද 1% (සියයට එකයි),
(4) විකුණුම් මිළෙන් 2 1/2% (සියයට දෙකහමාරක්) වන වෙන්දේසිකරුගේ කොමිස් මුදල,
(5) රු. 44,943/75 නොඉක්මවන සම්පූර්ණ ප්‍රචාරක වියදමින් 50%,
(6) ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
(7) විකිණීමේ කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තුව රු. 2,500.

හිමිකම් ඔප්පු හා වෙනත් අදාළ ලිපිලේඛන කොළඹ 03, ගාලු පාරේ අංක 90 සෙලින්කෝ සෙලාන් ටවර්හි 12 වන මහලේ සීමාසහිත සෙලාන් බැංකුවෙහි නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නීති දෙපාර්තමේන්තුව) වෙතින් ලබාගැනීම හා පිරික්සීම කළ හැකි ය.

දුරකථන අංක 4–701000– 2456789

ඩන්ස්ටන් කෙලාට්,
උසාවි කොමාසාරිස් හා බ්‍රෝකර්,
රජයේ සහතිකලත් විශේෂඥ වෙන්දේසිකරු
තක්සේරුකරු හා දේපළ නියෝජිත.

42, දුටුගැමුණු වීදිය,
පාමංකඩ,
දෙහිවල.
දුරකථන : 2814743
දුරකථන/ෆැක්ස් : 2814742, 2814744
ක්ෂණික ඇමතුම් : 0772250422

07-132

---

## මහජන බැංකුව - බේරුවල ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ 1999.04.19 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී මා වෙත පවරන ලද බලය පරිදි වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර තොටමුණ දකුණ, බේරුවල බැද්දෙ කරඳගොඩ පිහිටි, බලයලත් මිනින්දෝරු යූ. එම්. ද සිල්වා විසින් සාදන ලද 1976 ජනවාරි 02 දාතම හා අංක 1986 දරන පිඹුරේ ලොට් 2 වශයෙන් ලකුණුකොට ඇති, "කොටගෙවත්ත" නමැති බෙදාවෙන් කොට සීමා නිර්නය කළ බිම් කොටස එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ වගාවන් සහ අනෙකුත් සියලුම දේ සමඟ (ප්‍රමාණයෙන් අක් .00, රූඩ් 01, පර්. 37.91 ක ඉඩම ) මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය පරිදි ඉහත කී දේපළ මා විසින් 2007 ජූලි මස 28 වැනිදා සෙනසුරාදා පෙ. ව. 10.30 ට ආරම්භව බේරුවල, මහජන බැංකු ශාඛා පරිශ්‍රයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දේපළ වෙත ළඟාවන අන්දම .– කොළඹ – ගාල්ල මහා මාර්ගයේ බේරුවල දක්වා ගොස්, බේරුවල කතෝලික පල්ලිය සහ පොලී ස්ථානය අතරින් වම්පසට විහිදෙන ශාන්ත ආනා පාරට ඇතුළුවී, කරඳගොඩ හන්දිය දක්වා කි. මී. 1ක් පමණ ගමන්කොට දෙපසින් වැටී ඇති ගම්සහා පාර දෙක අතර යාබදව පිහිටි දේපළ වෙත ළඟාවන්න.

2000.02.11 *වන දින රජයේ ගැසට් පත්‍රයේ* සහ 2000.05.25 දින ඩේලිනිව්ස්, දිනමිණ, සහ තිනකරන් පුවත්පත් වල පළ කරන ලද යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය ද, 2007.07.06 දින රජයේ *ගැසට් පත්‍රයේ* පළ කළ විකුණුම් නිවේදනය ද බලන්න.

*ගාස්තු ගෙවන පිළිවෙල.–* සාර්ථක ගැණුම්කරු මිළ තීන්දු වූ වහාම පහත දැක්වෙන ගාස්තු මුදලින් ගෙවිය යුතුය.

1. ගැණුම් මිලෙන් 10% ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු පළාත් අධිකාරි බද්ද 1% ක් (සියයට එකක්),
3. විකුණුම් මිලෙන් (සියයට දෙකහමාරක්)2 1/2%ක වෙන්දේසිකරුගේ කොමිස් මුදල,
4. ලිපිකරු හා නිවේදක ගාස්තුව රු. 500 ක්,
5. විකුණුම් පිරිවැය හා වෙනත් අයකිරීම් වෙතොත් ඒවා,
6. අලෙවි සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි (සියයට අනූව )90% ක් වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත, පානදුර, ගාලු පාරේ, ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය (කළුතර) මහජන බැංකුව, ප්‍රාදේශීය කළමනාකරු වෙත ගෙවිය යුතුය. දුරකථනය 038-2232438 - 038 2235401.

එකී මුදල ඉහත දැක්වූ පරිදි දින 30ක් ඇතුළත ගෙවනු නොලැබුවහොත් ඒ වනවිටත් ගෙවා ඇති ගැණුම් මිළෙන් 10% (සියයට දහයක) මුදල රාජසන්තක කොට දේපල නැවත විකිණීමේ අයිතිය බැංකුව සතුය.

ඩන්ස්ටන් කෙලාව්,
උසාවි කොමසාරිස් සහ බ්‍රෝකර් රජයේ
සහතික ලත් විශේෂඥ වෙන්දේසිකරු,
තක්සේරුකරු සහ දේපල නියෝජිත.

42, දුටුගැමුණු වීදිය,
පාමංකඩ, දෙහිවල.
දුරකතනය : 2814743
ෆැක්ස් : 2814742 – 2814744.
ක්ෂණික ඇමතුම් : 07722-50422

07 –134

---

## සීමාසහිත සෙලාන් බැංකුව - කෙහෙල්වත්ත ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ සියනෑ කෝරළේ අධිකාරි පත්තුවේ කැලණිය උප නගර සභා සීමාව තුළ ගෝනවල ගමේ පිහිටියාවූ ද ගෝනගහවත්ත යයි කියනු ලබන හා හඳුන්වනු ලබන දැන් ලේඛවලේන් යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමේ බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. පී. ද සිල්වා විසින් සාදන ලද අංක 161 හා 1985.11.20 දින දරන පිඹුරේ ලොට් අංක 22 ලෙස ලකුණු කොට නිරූපණය කර ඇත්තා වූද පර්චස් පහළොවයි දශම හතරක් (අ.0, රූ.0, පර්. 15.4) විශාල වූ ද කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 466/69 යටතේ ලියාපදිංචි කර ඇත්තා වූ ද බෙදා වෙන් කරන ලද මුළු ඉඩම් කොටස සහ එහි පිහිටි ගොඩනැගිලි, වැව්ලි හා එහි දේපලට ස්ථිර ලෙස සවිකර ඇති උපකරණ හා යන්ත්‍රෝපකරණ හා එහි පිහිටි සියලු දේත්.

තවද එකී අංක 161 දරන පිඹුරේ ලොට් අංක 46, 44, 45 හා 48 දරන (පාර සඳහා වෙන් කිරීම වන) ඉඩම් කොටස් උඩින් හා දිගේ මාර්ග ප්‍රවේශ අයිතිය ද මීට ඇතුලත් වේ.

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ 2007 ජූලි මස 21 වන දින පෙරවරු 11.30 ට ඉහත සඳහන් දේපළ එම පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. රජයේ *ගැසට් පත්‍රයේ* 2007.03.30 වන දින දිණමිණ, ඩේලිනිවුස් සහ තිනකරන් යන පුවත්පත්වල 2007.03.19 වන දින ද යෝජනා සම්මුති දැන්වීම පළවී ඇත.

*දේපලට පිවිසීම.–* කැළණි විහාරය පසු කර බියගම පාරේ පැමිණෙන විට නාගහමුල්ල හන්දිය හමුවේ. එතැනින් වමට ඇති පාරේ දිවෙන ගෝනවල පාරේ කි. මී. 1 1/2 පමණ ගමන් කරන විට කරගහමුල්ල හන්දිය හමුවේ. එතැනින් වමට දිවෙන කීල්ස් නිවාස දෙසට දිවෙන පාරේ (මයිනර් රෝඩ්) මීටර් 500 ක් පමණ දුරින් දකුණු පස ගෝනවල උප තැපැල් කාර්යාලය අසල අංක 22 දරන ස්ථානයේ මෙම දේපල පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.–* වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවිය යුතුය.

(1) ගැණුම් මිලෙන් 10% ක්, (2) පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1% ක් (3) වෙන්දේසියේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2 % ක් (4) ලිපිකරු හා නිවේදන ගාස්තු වශයෙන් රුපියල් 500 ක් (5) විකුණුම් වියදම් සහ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල (6) විකුණුම් සහතික සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිළෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත මහජන බැංකුව, සහකාර සාමාන්‍යාධිකාරී (බටහිර - 1), නො. 11, ආදිපාද වීදිය, කොළඹ 01. දුරකථන අංක : 2387068, 2393678, 2327848 හිමිකම් හා වෙනත් අදාල විස්තර ඉහත ලිපිනයෙන් ලබාගත හැක. ඉහත සඳහන් කරන ලද පරිදි මුදල් දින 30 ක් ඇතුළත නොගෙවුවහොත් දැනට ගෙවා ඇති ගැණුම් මිලෙන් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

තුසිත කරුණාරත්න *(සාම විනිසුරු),*
බලයලත් වෙන්දේසිකරු,
උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත,
කොලොන්නාව.
දුරකථනය : 2696155, 2572940

07-108

## සීමාසහිත සෙලාන් බැංකුව - පානදුර ශාඛාව

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ සියනෑ කෝරළේ අධිකාරි පත්තුවේ බියගම ප්‍රාදේශීය සභා සීමාව තුල බොල්ලෑගල පිහිටි බලයලත් මිනින්දෝරු එම්. ඩබ්ලිව්. ඩී. එස්. ද සිල්වා විසින් සාදන ලද 1993.04.04 දිනැති අංක 2128 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන කෝන්ගහවත්ත *හෙවත්* කුරුඳුගහවත්ත නැමති ගොඩනැගිලි, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමේ කැබලි අංක 1 ලකුණු කළ කේ. ඊ. පෙරේරා මාවත, වරිපනම් අංක 141/7 දරන බෙදා වෙන් කරන ලද සම්පූර්ණ ඉඩම් කොටස අංක 2128 දරන සැලැස්ම අනුව රූඩ් දෙකයි පර්චස් තිස් එකයි දශම දෙකක් (අ.0, රූ.2, පර්. 31.2) ක් විශාල ඉඩම. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 532/27 යටතේ ලියාපදිංචි කර ඇත.

මෙම දේපල පානදුර පදිංචි බොල්ලෑගලගේ චිත්‍රා යන අය බන්ධනදායී වශයෙන් සීමාසහිත සෙලාන් බැංකුව වෙතින් ලබා ගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

ඉහත සඳහන් දේපළ 2007 ජූලි මස 24 වැනි දින පෙරවරු 10.30ට එම දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපලට පිවිසීම.*– කොළඹ සිට නුවර පාරේ යන විට පැලියගොඩ ඇති 4 වන සැතපුම් කණුවෙන් දකුණට ඇති බියගම පාරට හැරී කි. මී. 7-8 ක් ඉදිරියට ගිය විට හමුවන බොල්ලෑගල හන්දියෙන් වමට ඇති විජේරාම පාරට හැරෙන්න. එම පාරේ මීටර් 400 ක් ඉදිරියට ගිය විට හමුවන විජේරාම පන්සල අසලින් වමට ඇති කේ. ඊ. පෙරේරා මාවතට හැරෙන්න. (මෙම පාර පන්සල තාප්පය අසලින් පිහිටා ඇත.) එම පාරේ මීටර් 100 ක් ගිය විට හමුවන දකුණට ඇති වංගුවේ වම් පස පිහිටා ඇති නො. 221/4, අසලින් පිහිටා ඇති අඩි 15 ක් පළල බොරලු පාරේ මීටර් 100 ක් ගිය විට එම පාර අවසානයේ මෙම ඉඩම පිහිටා ඇත.

යෝජනා සම්මුති දැන්වීම රජයේ *ගැසට් පත්‍රයේ* 2007.04.20 දින පළවී ඇති අතර ඩේලිමිරර් පත්‍රයේ සහ ලංකාදීප පත්‍රයේ 2007.03.07 වන දින පළවී ඇත. සහ වීරකේසරී පත්‍රයේ 13.03.2007 වන දින පළවී ඇත.

*ගෙවීමේ ක්‍රමය.*– සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

(1) ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), (2) පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% ක් වන පළාත් අධිකාරි බද්ද (සියයට එකක්), (3) වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2 .5% (සියයට දෙකහමාරක්), (4) නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, (5) ලිපිකරු හා සෝෂක වේතනය රු. 500, (6) සියලුම ප්‍රචාරක වියදම් ද, ගැණුම් මිළෙන් ඉතිරි 90% ද, විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත සීමාසහිත සෙලාන් බැංකුවට ගෙවා නිමකළ යුතුය.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න: ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (නීති), සීමාසහිත සෙලාන් බැංකුව, අංක 90, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 011-2456285, 2456263, 2456284.

තුසිත කරුණාරත්න *(සාම විනිසුරු)*
බලයලත් වෙන්දේසිකරු සහ,
උසාවි කොමසාරිස්, තක්සේරුකරු.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත,
කොලොන්නාව.
දුරකථනය : 011 - 2696155, 2572940

07-109

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 0100005193.

ණයකරුගේ සම්පූර්ණ නම : මහතෙල්ගේ ටියුසන් සමන්ත පීරිස් සහ ලිඳමුලගේ රංජිනි සිල්වා

(මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2004.08.20 වැනි දින අංක 1355 දරන ආණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2004.08.21 වන දින "දිනමිණ", "ද අයිලන්ඩ්","තිනක්කුරල්" පුවත්පත්වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස (කෙසේ වුව ද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකර ගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ, 228/ඒ, වලව්වත්ත, කැස්බෑව යන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු වන ඒ. එස්. ලියනගේ මයා විසින් 2007.07.26 වන දින පෙ. ව. 11.00 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් එක්ලක්ෂ පනස් නම දහස් හත්සිය හතලිස් හයයි ශත හැට හයක් (රු.159,746.66) මුදලක් වර්ෂ 2003.07.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත සංස්ථාවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් එක්ලක්ෂ විසි දෙදහස් දෙසිය හැත්තෑ පහයි ශත එකොලහක (රු. 122,275.11) මුදල ද, 2003.07.31 වැනි දින දක්වා පොලිය වශයෙන් රුපියල් තිස්හත්දහස් හාරසිය හැත්තෑ එකයි ශත පනස් පහක් (රු. 37,471.55) ද, වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් එක්ලක්ෂ පනස් නම දහස් හත්සිය හතලිස් හයයි ශත හැට හයක් (රු. 159,746.66) ද,

(2) එකී රුපියල් එක්ලක්ෂ විසි දෙදහස් දෙසිය හැත්තෑ පහයි ශත එකොලහක (රු. 122,275.11) මුදල මත අයවිය යුතු වර්ෂයකට

15.00% බැගින් වන පොලියක් 2003.08.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීමට.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තුවේ සල්පිටි කෝරළේ මොරටුව නගර සහා සීමාවේ එගොඩ උයන ග්‍රාමයේ මහවත්ත පාරේ වරිපනම් අංක 250/11 හි පිහිටි මාදන්ගහවත්ත නැමැති ඉඩමට 1993/10/30 දින බී. එල්. ඩී. ප්‍රනාන්දු මානක තැන විසින් මැන සම්පාදිත අංක 4162 පිඹුර ප්‍රකාර ඉඩමට මායිම්, උතුරට: අඩි 20 ක් පළල පාර ද, නැගෙනහිරට: බී. සී. එස්. සිරිරත්නට අයත්ව තිබූ මෙම ඉඩමේම කොටසක් ද, දකුණට : සහ බටහිරට: බී. ඩී. එස්. සිරිරත්නට අයත් එම ඉඩමේම ඉතිරි කොටස ද යන මායිම් තුළ පර්චස් හයක් (අ.0, රූ.0, පර්.06) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළුදේද මාර්ග පරවශතාවය ද සමග කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 1979/119 හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

වර්ෂ 2007ක් වූ ජුනි මස 22 වැනි දින කොළඹ දී ය.

සාමාන්‍යාධිකාරී.

07-115

---

### රුහුණ සංවර්ධන බැංකුව – කැකණදුර ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

රුහුණ සංවර්ධන බැංකුවෙන් මා වෙත පවරන ලද බලය මත මෙහි පහත විස්තර වන දේපල 2007.08.02 දින පෙ.ව. 10.30ට එම දේපල පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

#### උකස් කර ඇති දේපළ පිළිබඳ විස්තරය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර කඩවත්සතර තුළ නාවිමන (දකුණේ) පිහිටි ගෙදරවත්ත හෙවත්, පැළකැටිය වත්ත නොහොත් ගබඩාගේවත්ත නැමති ඉඩමේ බෙදා වෙන් කරන ලද "ඒ" අක්ෂරය දරන රූඩ් එකයි පර්චස් හතක් (අක්කර 0, රූඩ් 01 පර්චස් 07) ක් විශාල ඉඩමේ සියළු ගහකොළ, පළතුරු ගොඩනැගිලි ආදී සියළු දේ ද වේ.

වැඩි විස්තර සඳහා 2002.01.04 දින *රජයේ ගැසට් පත්‍රයද*, 2003.02.14 දින දිනමිණ, තිනකරන් හා දී අයිලන්ඩ් යන පුවත්පත්වලද පළ කර ඇති වෙන්දේසි යෝජනාවට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.–* මාතර, දික්වැල්ල පාරේ කි. මී. 1 1/2ක් ගිය විට වෙළේවත්ත මංසන්ධිය හමුවේ. එතැනින් වමට හැරී වෙළේවත්ත පාරේ. කි. මී. 01ක් ගිය විට දීයගහ - අපරැක්ක පාර හමුවේ. එම පාරේ කි. මී. 02ක් පමණ ගිය විට නාවිමන දකුණ සමූපකාරය හමුවේ. එතැනින් වමට වැටී ඇති හුංගම් ගොඩ පාරේ කි. මී, 02ක් ගිය විට පාරේ දකුණු පසින් මෙම දේපල හමුවේ.

*ගෙවීමේ ක්‍රමය* - වෙන්දේසිය තීන්දු කළ විගස පහත සඳහන් මුදල් ගැණුම්කරු විසින් මුදලින් ගෙවිය යුතුය.

01. ගැණුම් මිළෙන් 25%ක් ද,
02. පළාත් අධිකාරියේ බදු සඳහා විකුණුම් මිලෙන් 1%ක් ද,
03. වෙන්දේසිකරුගේ කොමිස් 2 1/2%ක් ද,
04. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක් ද,
05. විකුණුම් වියදම සහ වෙනත් ගාස්තු ඇතොත් එම මුදලද වේ.

ගැණුම් මිලෙන් ඉතිරි 75%ක් වූ මුදල වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත මාතර, පඹුරන, අනගාරික ධර්මපාල මාවතේ අංක 382ඒ, දරන ස්ථානයේ පිහිටි රුහුණ සංවර්ධන බැංකුවේ, ප්‍රධාන කාර්යාලයේ සාමාන්‍යාධිකාරී මහතාට ගෙවිය යුතුය.

ඉහත සඳහන් පරිදි දින 30ක් ඇතුළත අදාළ මුදල නොගෙවුවහොත් දැනටමත් ගැණුම් මිලෙන් ගෙවා ඇති 25%ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

දුරකථන අංක : 041-2231532, 2226208, 2226209

පී. පී. ආනන්ද,
සාමවිනිසුරු, බලයලත් වෙන්දේසිකරු,
උසාවි කොමසාරිස් හා තක්සේරුකරු.

කුරුදුවත්ත, වල්ගම, මාතර.
දුරකථන අංකය : 041-2228731

07-24

---

### සීමාසහිත හැටන් නැෂනල් බැංකුව - වැලිමඩ ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන ) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බණ්ඩාරවෙල ප්‍රසිද්ධ නොතාරිස් එච්. රාජපක්ෂ විසින් සහතික කරන ලද්දාවූ ද සී/සහිත හැටන් නැෂනල් බැංකුවේ නමට ලියන ලද්දාවූ ද 2005.01.04 වන දින සහ අංක 70 දරන බැදුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම රත්නායක මුදියන්සේලාගේ පුංචි බණ්ඩා රත්නායක ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින්,

සී/ස හැටන් නැෂනල් බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියළු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියළුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපල 2007 ජූලි මස 23 වන දින පෙ.ව. 11.00ට ඇරඹෙන පරිදි දේපල පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, උඩුකින්ද කොට්ඨාශයේ, දඹවිනි පළාත කෝරළේ, රත් කරව්ව ගමේ පිහිටි "ගොන් එළවන මංකඩ" නමින් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මානක පී. ඩබ්. නන්දසේන විසින් 1994 ක්වූ නොවැම්බර් මස 13 වන දින මැන සාදන ලද අංක 660 දරන පිඹුර ප්‍රකාරව බෙදා වෙන් කරන ලද ලොට් 1 දරන ඉඩම.

*විශාලත්වය* : රූඩ් 01 යි පර්චස් 29

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2007.03.09 දින දරන *රජයේ ගැසට්* පත්‍රය හා 2007.03.21 වන දින අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය* - වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එක (1%)ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දහම පහ (2.5%) ක් ද,
4. ලිපිකරු හා සෝෂක ගාස්තු රුපියල් පන්සියය (රු. 500) ක් ද,
5. සියළුම ප්‍රචාරක වියදම්,
6. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහ (රු. 2,000)ක් ද වේ.

ගැණුම් මිලෙන් ඉතිරි 90%ක් වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත සීමාසහිත හැටන් නැෂනල් බැංකුව වෙත ගෙවිය යුතුය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති 10%ක මුදල අහිමි කිරීමට සහ දේපල නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා අදාළ ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ප්‍රධාන කළමනාකරු (ණය අයකිරීම්), සීමාසහිත හැටන් නැෂනල් බැංකුව, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10 දුරකථන අංක : 2661815, 2661816 ගෙන් ලබාගත හැක.

එන්. එච්. පී. එෆ්. ආරියරත්න,
උසාවි කොමසාරිස් හා බලයලත් වෙන්දේසිකරු.

අංක 34/31, සහ 32
නීතිඥ කාර්යාල සංකීර්ණය,
කොළඹ 12.

07-112

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන සංශෝධිත ගාස්තු

1995 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වේ.

(සෑම සිකුරාදා දිනයන්හි පළ කරනු ලැබේ.)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.

2. පෞද්ගලික පළකරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. කාර්යාල වේලාවන් පෙරවරු 9.00 සිට පස්වරු 4.45 දක්වා වේ.

4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.30 සිට පස්වරු 3.30 දක්වා බව සැලකිය යුතුයි.

5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති තැනට එවිය යුතුය.

6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ටයිප් ගසා එවිය යුතුයි. අත් අකුරින් යුතු කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.

7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතෙකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.

10. 1995 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේයි :-

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව | 51 | 0 |
| වැඩිවන සෑම අඟලකටම හෝ ඉන් කොටසකටම | 51 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට | 504 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට | 1,008 | 0 |

(අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)

11. සෑම සිකුරාදා දිනයකම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. සෑම මාසයකම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි.

13. 1995.01.01 දින සිට සංශෝධිත දායක ගාස්තුව* :-

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික)

| | මෙරට | | පිටරට | |
|---|---|---|---|---|
| | රු. | ශ. | රු. | ශ. |
| I වන කොටස සම්පූර්ණයෙන් (I, II, III ඡේද තුනම ඇතුළත්) | 1,612 | 0 | 2,098 | 0 |
| II වන කොටසේ සිට VI වන කොටස දක්වා එක කොටසක් | 572 | 0 | 745 | 0 |
| I වන ඡේදය | 520 | 0 | 1,007 | 0 |
| II වන ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර්, විභාග ආදිය) | 624 | 0 | 1,009 | 0 |
| III වන ඡේදය | 468 | 0 | 907 | 0 |
| අති විශේෂ ගැසට් පත්‍රය | 3,360 | 0 | 4,422 | 0 |

ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ 12 මාසයකට නොඅඩු කාලසීමාවකට පමණය.

*තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | මිළ ගාස්තුව | | තැපැල් (මෙරට) | |
|---|---|---|---|---|
| | රු. | ශ. | රු. | ශ. |
| (අ) I වන කොටස | 31 | 0 | 5 | 0 |
| II වන කොටසේ සිට VI වන කොටස දක්වා එක කොටසක් | 11 | 0 | 5 | 0 |
| (ආ) I වන ඡේදය | 10 | 0 | 5 | 0 |
| II වන ඡේදය | 12 | 0 | 5 | 0 |
| III වන ඡේදය | 9 | 0 | 5 | 0 |

* දායක මුදල් භාරගැනීම සහ තනිපිටපත් විකිණීම භාර කොළඹ 01 ලෝටස් පාර, අංක 32හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනයද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා ගැසට් පත්‍රයට දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියළු දෙනාගේම පහසුවටද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ 01, ලෝටස් පාර, අංක 32හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.**

*සැළකිය යුතුයි.*- මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළකිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2007** | | | |
| ජූලි | 2007.07.06 | සිකුරාදා | 2007.06.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.07.13 | සිකුරාදා | 2007.06.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.07.20 | සිකුරාදා | 2007.07.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.07.27 | සිකුරාදා | 2007.07.13 | සිකුරාදා | දහවල් | 12.00 |
| අගෝස්තු | 2007.08.03 | සිකුරාදා | 2007.07.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.08.10 | සිකුරාදා | 2007.07.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.08.17 | සිකුරාදා | 2007.08.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.08.24 | සිකුරාදා | 2007.0810 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.08.31 | සිකුරාදා | 2007.08.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| සැප්තැම්බර් | 2007.09.07 | සිකුරාදා | 2007.08.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.09.14 | සිකුරාදා | 2007.08.31 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.09.21 | සිකුරාදා | 2007.09.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.09.28 | සිකුරාදා | 2007.09.14 | සිකුරාදා | දහවල් | 12.00 |

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2007 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.